# තනතුරු පුරප්පාඩු

## කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

## කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ පවත්නා පහත සඳහන් පුරප්පාඩුව සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. අධ්‍යක්ෂ ජනරාල් (තනතුරු 01)

**තනතුරට පැවරෙන කාර්යයන්**

මණ්ඩලයේ පරිපාලන කටයුතු, මානව සම්පත් කටයුතු, විනය කටයුතු ක්‍රියාත්මක කිරීම, මූල්‍ය කටයුතු මෙහෙයවීම, මණ්ඩලයේ සමස්ත යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරවීම, ඒ සඳහා සියලු කාර්ය මණ්ඩල මෙහෙයවීම, දිරි ගැන්වීම, අධීක්ෂණය කිරීම මගින් ආයතනික සමස්ත අරමුණු ඉටුකර ගැනීම හා ඒ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට වගකීම.

**සුදුසුකම් හා පළපුරුද්ද :**

i. **බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම.**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක කළමනාකරණය/ව්‍යාපාර පරිපාලනය/ වාණිජ්‍යය/ආර්ථික විද්‍යාව/නීතිය යන විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් උපාධියක් සහිතව අදාළ එක් විෂයකින් ලබාගත් විද්‍යාපති / ශාස්ත්‍රපති පශ්චාත් උපාධියක් සමග රාජ්‍ය අංශයේ/ සංස්ථා හෝ මණ්ඩල සේවයේ/ පිළිගත් මහා පරිමාණ පුද්ගලික සමාගමක කළමනාකරණ මට්ටමේ වසර 18 ක පළපුරුද්ද (මින් අවම වශයෙන් වසර 03 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය)

ii. **අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම.**

**සුදුසුකම්**

මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ (HM 1-1) සේවා ශ්‍රේණියේ තනතුරක වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**අනිවාර්ය සුදුසුකම්**

සුදුසුකම් ලැබීම සඳහා වන සේවා කාලය තුළ සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබිය යුතු අතර, එම කාලය තුළ විනයානුකූල දඬුවම් ලබා නොතිබිය යුතුය.

**වැටුප් පරිමාණය :**

2016.04.25 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන 1 අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය HM 1-3 රු. 86,865 – 15X2270 – 120,915/- (HM 1-3 2016) වේ. (මීට අමතරව මණ්ඩලය විසින් අනුමත අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ.)

**වයස් සීමාව :**

වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**අතිරේක සුදුසුකම් :**

i. ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව

ii. පරිගණක භාවිතය පිළිබඳ දැනුම හා ඒ පිළිබඳ වෘත්තීය අධ්‍යාපන සුදුසුකම් තිබීම.

**වෙනත් :**

**සෑම අපේක්ෂකයෙක්ම,**

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ආ) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(ඇ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**බඳවා ගන්නා ආකාරය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

**සේවා කොන්දේසි :**

මෙම තනතුර ස්ථිරය. සේවා දායකයා විසින් වැටුපින් 10% ක් සහ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මගින් 15% යත පදනම යටතේ සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවනු ඇත. මණ්ඩලය මගින් වැටුපෙන් 3%ක් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා ද දායකත්වය සලසනු ලැබේ.

දැනටමත් රාජ්‍ය දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ සංස්ථාවල සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු අතර, ඔවුන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ. තවද අපේක්ෂකයා තෝරා ගනු ලැබුවහොත් මසක කාලයක් ඇතුළත ඔහු සේවයෙන් මුදාහැරිය හැකි බව එම ආයතනයේ ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.

අයදුම්පත් ඉදිරිපත් කරන ආකාරය :

නම, ලිපිනය, වයස, අධ්‍යාපනික සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සම්පූර්ණ විස්තර ඇතුළත් අයදුම්පත්, සහතිකවල පිටපත් සහ අයදුම්කරුගේ ඥාතීන් නොවන තොරතුරු දන්න ගත හැකි පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් ද සහිතව 2024.04.19 වෙනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සහතිකවල පිටපත් අමුණා නැති හා නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී තමන් අයදුම් කරන තනතුර කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කර එවිය යුතුය. බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසන් තීරණය අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

**සභාපති,**
**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය,**
**අංක 117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ.**
**2024.03.22**